# සාමාන්‍ය සමයේ විසිහයවන සතිය
# සිකුරාදා

## පළමුවන කියැවීම

බාරුක් දිවැස්ප්‍රසාදි තුමන්ගේ පොතෙන් ගත් පාඨයෙකි.

බාරුක් 1 : 15-22

"දෙවි ස්වාමින් වහන්සේට අප්‍රසන්න දේ කළෙමු."

"අවංකභාවය අපේ දෙවි ස්වාමින් වහන්සේට හිමි ය. අද දින ජුදාහි සෙනඟ සහ ජෙරුසලමෙහි පුරවැසියන් වන අපි එනම් අපේ රජවරු ද රාජ කුමරුවෝ ද, අපේ පූජකවරු ද අපේ මුතුන් මිත්තන් මෙන් අපේ දිවැසිවරු ද, සමිඳාණන් වහන්සේ ඉදිරියෙහි පව් කළ බැවිනුත්, අකීකරු වූ බැවිනුත්, අප උදෙසා පිළියෙළ කළ, අපට අනුගමනය කිරීමට කී, අපේ දෙවි ස්වාමින් වහන්සේගේ හඬට අප සවන් නුදුන් බැවිනුත් අද දින ලජ්ජාවට පත් වී සිටිමු. සමිඳාණන් වහන්සේ අපේ මුතුන් මිත්තන් මිසර දේශයෙන් පිටතට ගෙනා දවසේ පටන් අද දක්වා අපි අපේ දෙවි ස්වාමින් වහන්සේට අකීකරු වූයෙමු. උන් වහන්සේගේ හඬට සවන් දීම ප්‍රතික්ෂේප කොට අපි උන් වහන්සේට පක්ෂපාත නොවී සිටියෙමු.

එබැවින් අද අප අත්දකින දුර්භාග්‍යය සහ අපට කිරි සහ මී පැණියෙන් ඉතිරී යන දේශයක් දෙනු පිණිස සමිඳාණන් වහන්සේ අපේ පියවරුන් මිසර දේශයෙන් පිටතට ගෙනැවිත්, උන්වහන්සේගේ සේවක මෝසෙස් ලවා උන් වහන්සේ දුන් ශාපය අප පිට පැමිණ තිබේ. උන් වහන්සේ අප වෙත එවූ ඒ දිවැසිවරයන්ගේ සියලු පණිවුඩ නොසලකා, අපි අපේ දෙවි ස්වාමින් වහන්සේගේ හඬට සවන් නොදී සිටියෙමු. එහෙත් අපි සියල්ලෝ ම අපේ නපුරු සිත්වල හටගත් චේතනා, ක්‍රියාත්මක කරමින්

බොරු දෙවි දේවතාවන් හට වැඳුම් පිදුම් කරමින් අපේ දෙවි ස්වාමින් වහන්සේට අප්‍රසන්න වන දේ කළෙමු.

දේව වචනය මෙසේ ය.

## පිළිතුරු ගීය

ගීතාවලිය 79: 1-5, 8-9

පිළිතුර: දෙවිඳුනි, ඔබේ මහිමාන්විත නාමය නිසා අප මුදා ගත මැනව.

ගීය:

අහෝ දෙවිඳුනි, මිසදිටුවෝ ඔබේ උරුමය ආක්‍රමණය කළෝ ය.
ඔබේ ශුද්ධ මාලිගාව කෙලෙසුවෝ ය.
ජෙරුසලම් නගරය නටබුන් ගොඩක් කළෝය.
ඔබේ සේවකයන්ගේ මළ කඳන් ඔව්හු ආකාශ පක්ෂීන්ට කෑමට ද
ුන්නෝ ය.

ඔබේ දැහැමියන්ගේ මාංශය මිහිපිට තිරිසනුන්ට කෑමට දුන්නෝ ය.
ඔව්හු ඔවුන්ගේ ලේ ජෙරුසලම වටා ජලය මෙන් වැගිරෙව්වෝ ය.
ඔවුන් වැළලීමට කිසිවෙක් නොසිටියෝ ය.

අපේ අසල්වැසියන් හට අපි සරදමක් වූයෙමු. අප අවට සිටින්නන් හට විහිළුවක් ද නින්දාවක් ද වූයෙමු.
අහෝ සමිඳුනි! ඔබ කොපමණ කල් කෝප වී සිටින සේක් ද?
සදහට ම ද? ඔබේ උදහස කොපමණ කල් ගින්න මෙන් දැවෙන්නේ ද
?

අපේ පියවරුන්ගේ දුෂ්ට ක්‍රියා අපට විරුද්ධ ව සිහි නොකළ මැනව.
ඔබේ මෘදු දයාව අප කෙරෙහි විගස පැමිණෙව්ව මැනව.

අපේ බලාපොරොත්තු සියල්ල සුන් වී ඇත.
අපේ මිදුම්කාර දෙවිඳුනි, ඔබේ මහිමාන්විත නාමය නිසා අපට සරණ වුව මැනව. ඔබේ නාමය උදෙසා අප මුදා අපට කමා කළ මැනව.

## සුපුවත් ජය නද (දෙවසරේම)

ආලේලූයා! ආලේලූයා!
සමිඳාණෝ සියලු පොරොන්දු ඉටු කරන සේක.
තමන් කරන සියල්ලේ දී මෙත් සිත් වඩන සේක.
ආලේලූයා!

නොහොත්

ආලේලූයා! ආලේලූයා!
අපේ සිත් දැඩි කර නොගෙන සමිඳාණන් පවසන දෙයට සවන් දෙන්න.
ආලේලූයා!

# සුවිශේෂය

ලූක් තුමාගේ ශුද්ධවූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.

ලූක් 10: 13-16

"මා ප්‍රතික්ෂේප කරන තැනැත්තා මා එවූ තැනැත් වහන්ස් ප්‍රතික්ෂේප කරන්නේ ය."

මනස්ථාපනය නොවූ නුවරවලට ජේසුස් වහන්සේ මෙසේ වදාළ සේක.

"එම්බා කොරාශිනය, ඔබට වන විපතක මහත! එම්බා බෙත්සයිදාව, ඔබට වන විපතක මහත! ඔබ තුළ කළ ප්‍රබල ක්‍රියා තීර්හි සහ සීදොන්හි කළා නම්, මීට කලින් ගෝනි රෙදි හැඳ අළු තවරා ගෙන මනස්ථාපනය වීමට ඔවුන්ට ඉඩ තිබිණි. එසේ වුව ද දේව විනිශ්චය දවසේ දී ඔබට වඩා තීර්ට හා සිදොනට සහනය ලැබෙන්නේය.

එම්බා කපර්ණාවුම, ඔබ සග ලොව දක්වා උසස් කරනු ලබන්නෙහි ද? නැත. පාතාලය දක්වා පහත හෙළනු ලබන්නෙහි ය. ඔබගේ වචනය අසන්නා මාගේ වචනය අසයි. ඔබ ප්‍රතික්ෂේප කරන්නා මා ප්‍රතික්ෂේප කරයි. මා ප්‍රතික්ෂේප කරන්නා මා එවූ තැනැත් වහන්සේ ප්‍රතික්ෂේප කරන්නේය."

සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය.